# ලක්දිව අතීත භික්ෂු සමාජය හා ආරාම පාලනය පැවති ආකාරය පිළිබඳව කෙරෙන විමර්ශනයක් (මිහින්තලා පුවරු ලිපිය ඇසුරින්)

පූජ්‍ය ඉරුදෙණියායේ නන්ද හිමි*

පැරණි ලක්දිව භික්ෂු සමාජය හා ආරාම පාලනය පිළිබඳ වඩාත් වැදගත් තොරතුරු හෙළි කරණු ලබන්නේ සෙල්ලිපි මඟිනි. එම විහාර කතිකාවත් අතර ජේතවනාරාම සංස්කෘත ලිපිය, පස්වන කාශ්‍යප රජුගේ(ක්‍රි.ව. 915-924) අභයගිරි පුවරු ලිපිය, හතරවන සේන රජුගේ(ක්‍රි.ව. 952-955) කළුදිය පොකුණ ලිපිය හා හතරවන මිහිඳු රජුගේ(ක්‍රි.ව. 955-972) මිහින්තලා පුවරු ලිපිය යන කතිකාවත් අතිශය වැදගත් වේ. මෙකී විහාර කතිකාවත් අතර දීර්ඝතම වූ ද අංග සම්පූර්ණ වූ ද ලේඛනය ලෙස මිහින්තලා පුවරු ලිපිය දැක්විය හැකිය. ලක්දිව සෙල්ලිපි අතර මහජනයාගේ සම්භාවනාවට පාත්‍ර වූ මෙවන් වැදගත් කතිකාවතක් දැකිය නොහැකි තරම්ය. සැදැහැති රජුන් පෙරටු කරගත් දායක පිරිස විහාරාරාමවලට කෙත්වතු පූජා කිරීම දහවන ශතවර්ෂය වන විට පෙර යුගයටත් වඩා අධික විය. එසේම මේ හා සමගාමීව කාලයට හා දේශයට අනුව අමුතු අලුත් ආර්ථික තත්ත්වයකට මුහුණ පාන්නට සිදුවීමෙන් භික්ෂූන්ගේත් රටවැසියාගේත් අදහස් හා වැඩපිළිවෙල වෙනස් වීමෙන් නව ආරාමික ජීවිතයක් ලක්දිවට පහළ විය. මෙසේ බෞද්ධ විහාරාරාම පාලනය සඳහාත් එහිම අභ්‍යන්තරික ජීවිතය පිළිබඳවත්, ඒ සඳහා පැන වූ නීතිරීති පිළිබඳ ඉතිහාසය විමසීමේදීත් මෙම සෙල්ලිපිය අතිශය වැදගත් වේ.

භික්ෂූන්ගේ ආජීව පාරිශුද්ධිය උදෙසා ප්‍රජාතන්ත්‍රවාදී පදනමකින් සම්මත කරන ලද නීතිරීති ඇතුළත් වූ මිහින්තලා පුවරු ලිපිය ඓතිහාසික වශයෙන් අතිශය වැදගත් කොට සැලකිය හැක. සංවිධානාත්මක පාලන ක්‍රමයක තිබිය යුතු සභා ක්‍රමය. ඒකාධිපතිත්වයට වඩා පොදු මතයට ගරු කළ බව අන්තර්ගත කරුණු අතර කැපී පෙනේ. තදීය සංඝ සමාජයේ පැවැත්ම අධ්‍යයනය කිරීමටත් උසස්තම මෙන්ම සංවිධානාත්මක පරිපාලන ක්‍රමයක ලක්ෂණ අධ්‍යයනය කිරීමටත් තදීය සමාජ ආර්ථික වටපිටාව තුළ අතරමං වූ සංඝාරාමයක භික්ෂූන්ගේ ක්‍රියාකලාපය බුද්ධනීති පවා ඉක්මවා සමාජානුගත වූ ආකාරය අධ්‍යයනයේදීත් මිහින්තලා පුවරු ලිපිය අතිශය වැදගත් කොට සැළකිය හැකි බව තහවුරු විය

මෙහිදී අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් ප්‍රාථමික මූලාශ්‍රය ලෙස *Epigraphia Ceylanica* කෘතියේ එන *මිහින්තලා පුවරු ලිපියත්* අනෙකුත් ද්විතීයික මූලාශ්‍රයත් භාවිතා කරන්නට යෙදුණි. එකී මූලාශ්‍රයන් පරිශීලනය කරමින් මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ, ලක්දිව අතීත භික්ෂු සමාජය හා ආරාම පාලනය පැවති ආකාරය අධ්‍යයනය කිරීමයි.

ප්‍රමුඛ පදඃ ආරාම පාලනය, භික්ෂු සමාජය, මිහින්තලා පුවරු ලිපිය, කතිකාවත, නීතිරීති

* ඉතිහාස අධ්‍යයන අංශය, සමාජීයවිද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය.

nanda91619@gmail.com